Liberté • Égalité • Fraternité
RÉPUBLIQUE FRANÇAISE
MINISTÈRE DE LA JUSTICE

10

# අයිතීන් පිළිබඳ ප්‍රකාශනය

## (අධිකරණයේ) පෙනී සිටීම කඩිනමින් සිදු කළ යුතු ක්‍රියාපටිපාටියක් යටතේ රිමාන්ඩ් භාරයේ සිටින පුද්ගලයකුට ඇති සහන

### හෝ පරිවාස භාරයෙන් ඉවත් කිරීමෙන් පසු ව චෝදනා පත්‍රයක් මත පෙනී සිටි පුද්ගලයකුට ඇති සහන

ඔබ අපරාධ අධිකරණයට ඉදිරිපත් කෙරෙන අතර ඔබට එරෙහි ව චෝදනා නගා ඇති ක්‍රියා සම්බන්ධයෙන් තීන්දු කරනු ලබන නඩු විභාග දිනය තෙක් ඔබ ව රිමාන්ඩ් භාරයේ තැබෙනු ඇත. ඔබට රැකවරණය ලැබිය හැකි මූලික අයිතීන් මෙම ලේඛනයෙන් දක්වා ඇත.

***<u>රිමාන්ඩ් භාරයේ සිටින මුළු කාල සීමාව පුරාවට ම ඔබට මෙම ලේඛනය ඔබ සන්තකයේ තබා ගත හැක</u>***

**වරදකාරී ක්‍රියාව සිදු කිරීම පිළිබඳ දැනුම**

ඔබ හට චෝදනා නගා ඇති වරදකාරී ක්‍රියාව සිදු කරන ලදැයි නිගමනය කර ඇති දිනය, ස්ථානය සහ ඊට අදාළ සීමා සම්බන්ධයෙන් ද රිමාන්ඩ් භාරයට පත් කරවීම සාධාරණීකරණය කළ හැකි හේතු දැන ගැනීමට ඔබට අයිතියක් ඇත.

**නීතිඥවරයකුගේ සහාය ලබා ගැනීම**

ඔබ විසින් තෝරා පත් කළ හෝ ඔබ වෙනුවෙන් පත් කළ නීතිඥවරයකුගේ සහාය ලබා ගැනීමට ඉල්ලීමක් කිරීමට ඔබට හැකියාවක් ඇත.
ඔබගේ නීතිඥවරයා සමග නිදහසේ අදහස් හුවමාරු කර ගැනීමට හෝ ලිඛිත මාර්ගයෙන් සන්නිවේදනය කිරීමට ඔබට හැකියාව ඇති අතර ඔබට අදාළ සියලු විභාග කිරීම් වල දී ඔහුගේ සහාය ලබා ගැනීමට හැකි අතර අදාල විභාග කිරීම් පිළිබඳ ව නීතිඥවරයාට කලින් දැන්වීම කළ යුතු වේ.

**නිශ්ශබ්ද ව සිටීමට ඇති අයිතිය**

අධිකරණය ඉදිරියේ දී ප්‍රකාශයක් සිදු කරන්නේ ද අසන ලද ප්‍රශ්න වලට පිළිතුරු දෙන්නේ ද නැතහොත් නිශ්ශබ්ද ව සිටින්නේ යන්න තීරණය කිරීම ඔබට සිදු කළ හැක.

**භාෂා පරිවර්තකයකුගේ සහාය ලබා ගැනීම**

ඔබට ප්‍රංශ භාෂාව කථා කළ නොහැකි නම් හෝ තේරුම්ගත නොහැකි නම් ඔබ හට කිසිදු ගාස්තුවක් නොමැති ව, ඔබගේ ප්‍රශ්න කිරීම අතරතුර සහ ඔබගේ නීතිඥවරයා සමග අදහස් හුවමාරු කර ගැනීම සඳහා භාෂා පරිවර්තකයකුගේ සහාය පැතීමට අයිතිය ඇත.

**ඔබව නිදහස් කිරීමට ඉල්ලා සිටීමට ඔබට ඇති අයිතිය**

ඕනෑ ම අවස්ථාවක අධිකරණයෙන් නිදහස් කරන මෙන් ඔබට ඉල්ලීමක් කළ හැක.

**මානුෂීය නිදහස පැහැර හැරිය හැකි කාල සීමාව**

ඔබ අපරාධ අධිකරණයේ පෙනී සිටින දිනය තෙක් හෝ වෙනත් අළුත් පෙනී සිටින දිනයක් දක්වා ම ඔබ ව රිමාන්ඩ් භාරයට ගැනීම බලපැවැත්වෙනු ඇත.

සිවිල් අයිතීන් සහ රඳවා ගැනීම් භාර විනිසුරුවරයා විසින් ඔබ ව අධිකරණයේ පෙනී සිටීම කඩිනමින් සිදු කළ යුතු කාර්ය පටිපාටියක් යටතේ රිමාන්ඩ් භාරයේ පසු වන්නේ නම් එකී රැඳවුම වැඩ කරන දින 3 කට වඩා නොඉක්මවිය යුතු ය.

අපරාධ අධිකරණය හමුවට පැමිණවීම බලාපොරොත්තුවෙන් සිදු කරන ලද පරිවාස භාරයේ තැබීමට වන නියෝගයට ගරු නොකිරීම හේතුවෙන් ඔබ ව රිමාන්ඩ් භාරයේ තැබීමට සිවිල් අයිතීන් සහ රඳවා තබා ගැනීම් භාර විනිසුරුතුමා විසින් කරනු ලැබ ඇති නියෝගය මත එකී රඳවා තබා ගැනීම මාස 2 කට වඩා දීර්ඝ කිරීමේ හැකියාව ඇත.

අපරාධ අධිකරණය විසින් ඔබගේ නඩුව වෙනත් දිනකට කල් තැබීමේ දී ඔබ ව රිමාන්ඩ් භාරයට පත් කරන්නේ නම් ඔබේ රැඳවුම් කාලය සති 6 ක කාලයකට වඩා වැඩි විය නොහැකි අතර ඔබට එරෙහි ව ඇති චෝදනා වලට දඬුවම 7 වසරකට වැඩි සිර දඬුවමක් නම් එම රැඳවුම් කාලය මාස 4 ක් විය හැක.

**යම් පුද්ගලයන් පිළිබඳ තොරතුරු**

ඔබ විසින් රිමාන්ඩ් භාරයට පමුණුවනු ලදුව ඔබ කැමති පුද්ගලයකුට සහ විශේෂයෙන් ම ඔබගේ පවුලේ සාමාජිකයන්ට ඒ බව දැන්වීමට ඔබට අයිතියක් ඇත.

ඔබ විදේශීය ජාතිකයකු නම් තවදුරටත් ඔබට ඔබගේ රටේ තානාපති අංශ වෙත දැනුම් දීමේ හැකියාව ඇත.

**වෛද්‍යවරයකු ලවා පරීක්ෂා කර ගැනීම**

වෛද්‍යවරයකු ලවා පරීක්ෂා කර ගැනීමට ඔබට ඉල්ලීමක් කළ හැක.

**ඔබගේ නඩු ගොනුවට ඇති ප්‍රවේශය**

ඔබගේ නීතිඥවරයාට ඔබගේ නඩු ගොනුව පරීක්ෂා කිරීමට හැකි අතර එහි පිටපත් ලබා ගැනීමට ඉල්ලීමක් ද කළ හැක. එසේ ම ඒවායේ පිටපත් ඉල්ලා සිටීමට ද ඔබට අයිතියක් ඇත.